**සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුවේ සමුපකාර අතිරික්ත අරමුදල - 2013**

---

සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුවේ සමුපකාර අතිරික්ත අරමුදලේ 2013 දෙසැම්බර් 31 දිනට ශේෂපත්‍රය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(3) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධි විධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. අරමුදලේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත්කළ යුතුයැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් සහ නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 **මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම**

---

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

## 1.3 **විගණකගේ වගකීම**

---

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000-1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරීවන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අරමුදලේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් අරමුදලේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගැයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගැයීමද විගණනයට ඇතුළත් වේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.4 **තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

---

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ .

**2.** **මූල්‍ය ප්‍රකාශන**

**2.1** **තත්ත්වාගණනය කළ මතය**

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, සමූපකාර අතිරික්ත අරමුදලේ මූල්‍ය ප්‍රකාශනවලින් 2013 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**2.2** **මූල්‍ය ප්‍රකාශන පිළිබඳව අදහස් දැක්වීම**

**2.2.1** **ගිණුම්කරණ අඩුපාඩු**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ගණනය කිරීමේ දෝෂ හේතුවෙන් සමාලෝචිත වර්ෂයට අදාළ ස්ථාවර වත්කම් අයිතම් 23 ක ක්ෂය රු. 84,101 ක් වැඩියෙන් දක්වා තිබුණි.

(ආ) බැංකු ගිණුමක ඇතුළත්ව තිබූ 2010 හා 2011 වර්ෂ වලට අදාළ එකතුව රු.237,482 ක් වූ සෘජු බැර 09 ක් සහ එකතුව රු.805,634 ක් වූ බැංකු ණය ලැබීම් 02 ක් හඳුනාගෙන විගණිත දිනය වූ 2015 පෙබරවාරි 28 වන විටත් අවශ්‍ය ගැලපීම් සිදුකර නොතිබුණි.

**2.2.2** **නොසැසඳුනු පාලන ගිණුම්**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, වත්කම් ශේෂ 03 ක ශේෂයන් ඊට අදාල උපලේඛනවල දැක්වෙන ශේෂයන් සමඟ සැසඳීමේදී එකතුව රු.260,606,703 ක වෙනසක් නිරීක්ෂණය විය.

**2.2.3** **අවිනිශ්චිත ගිණුම්**

මූල්‍ය ප්‍රකාශනවල දිගින් දිගටම ඉදිරියට ගෙනවිත් තිබූ රු.9,475,735 ක් වූ අවිනිශ්චිත ගිණුමේ ශේෂය නිරවුල් කිරීමට සමාලෝචිත වර්ෂය තුළදීත් කටයුතු කර නොතිබුණි.

**2.3** **ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්**

වර්ෂ ගණනාවක සිට ඉදිරියට ගෙන එමින් පවතින රු.375,504 ක් වූ වැඩිපුර අයවීම් ශේෂ 02 ක්, රු.1,716,566 ක් වූ අගරු චෙක්පත් හා රු.10,221,723 ක් වූ බැරකම් ශේෂ 05 ක් සමාලෝචිත වර්ෂය අවසානය වන විටත් නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

**2.4** **විගණනය සඳහා සාක්ෂි නොවීම**

පහත සඳහන් විෂයයන් ඉදිරියෙන් දක්වා ඇති සාක්ෂි විගණනයට ඉදිරිපත් නොවීය.

| විෂයය | වටිනාකම | ඉදිරිපත් නොකළ සාක්ෂි |
| --- | --- | --- |
| | රු. | |
| (අ) සමූපකාර සමිති ණය | 560,194,930 | ශේෂ තහවුරුකිරීමේ ලිපි හා උපලේඛන |
| (ආ) ව්‍යාපෘති ණය | 5,000,000 | - එම - |

## 2.5 නීති,රීති,රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම.

පහත සඳහන් අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| නීති,රීති,රෙගුලාසි යනාදියට යොමුව | අනුකූල නොවීම |
| --- | --- |
| (අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | |
| (i) මුදල් රෙගුලාසි 395 (ආ) | මාසික බැංකු සැසඳුම් ප්‍රකාශන ඊළඟ මාසයේ 15 වන දිනට පෙර විගණකාධිපතිවරයාට ඉදිරිපත් කළයුතු වුවත්, ඒ අනුව, කටයුතු කර නොතිබුණි. |
| (ii) මුදල් රෙගුලාසි 396 | 2013 සහ ඊට පෙර වර්ෂවල නිකුත් කළ නමුත් ගෙවීමට ඉදිරිපත් නොවූ වටිනාකම රු.80,867 ක් වූ චෙක්පත් 06 ක් සම්බන්ධයෙන් 2015 පෙබරවාරි 28 දින වන විටත් කටයුතු කර නොතිබුණි. |
| (ආ) 2006 දෙසැම්බර් 22 දිනැති අංක පීඑෆ්/423 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 4.3 වගන්තිය | ගිණුම් වර්ෂය අවසන් වී මාස 02 ක් ඇතුළත සමාලෝචිත වර්ෂය වෙනුවෙන් වූ කාර්යසාධන වාර්තාව සමඟ සමුච්චිත අරමුදලේ වෙනස්කම් දැක්වෙන ප්‍රකාශයක් රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනරාල්වරයාට පිටපතක් සහිතව විගණකාධිපතිවරයාට ඉදිරිපත් කළ යුතු වුවත්, ඒ අනුව කටයුතු කර නොතිබුණි. |

## 2.6 ප්‍රමාණවත් අධිකාර බලයකින් තහවුරු නොවූ ගනුදෙනු

1974 ජනවාරි 10 දිනැති ශ්‍රී ලංකා ජනරජයේ අංක 93/5 දරන ගැසට් පත්‍රයේ 44 (iii) වගන්තිය ප්‍රකාර අතිරික්ත අරමුදලේ මුදල් ප්‍රාථමික සමූපකාර සමිතිවල කොටස් මිලදී ගැනීමට, ස්ථාවර වත්කම් මිලදී ගැනීමට, ඇවරකරුවෙකුට විරුද්ධව පවතින නඩුවලදී ඔහුගේ නිදහසට ක්‍රියාකිරීම සඳහා ආධාර කිරීම හා ලියාපදිංචි සමූපකාර සමිති සඳහා ආධාර කිරීමට පමණක් යෙදිය යුතු වුවද, ඊට පටහැනි කාර්යයන් තුනක් සඳහා එකතුව රු.95,174,250 ක් වැය කර තිබුණි.

**3.** **මූල්‍ය සමාලෝචනය**

**3.1** **මූල්‍ය ප්‍රතිඵල**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, සමාලෝචිත වර්ෂය සඳහා අරමුදලේ මෙහෙයුම් කටයුතුවල මූල්‍ය ප්‍රතිඵලය රු.27,722,806 ක අතිරික්තයක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂය සඳහා රු.33,360,994 ක අතිරික්තයක් වූයෙන් මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.5,638,188 ක පිරිහීමක් නිරීක්ෂණය විය. ස්ථාවර තැන්පත් ඇපයට තබා ලබාගත් ණය සඳහා පොළී ගෙවීම් රු.60,851,569 කින් වැඩිවීම ඊට ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

**4.** **මෙහෙයුම් සමාලෝචනය**

**4.1** **කළමනාකරණ අකාර්යක්ෂමතා**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2013 දෙසැම්බර් 31 දින වනවිට අයවිය යුතු සමූපකාර සමිති ණය ශේෂය රු.647,215,868 ක් වූ අතර ඉන් සියයට 14.8 ක් හෙවත් රු. 95,785,091 ක ණය අක්‍රිය තත්ත්වයේ පැවති අතර එම ශේෂය වසර 05 ක් ඉක්මවා තිබුණි. එසේම රු. 551,430,777 ක් වූ සක්‍රිය ණය ශේෂයෙන් රු.41,905,020 ක් වසර 05 ඉක්මවා තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ අරමුදලේ බැංකු ජංගම ගිණුමේ ශේෂය සෑම මාසයකම රු.මිලියන 2 කට වඩා වැඩියෙන් තිබුණු අතර මාසික සාමාන්‍ය වියදම පුරෝකථනය කර එම ගිණුමේ ශේෂය පොළී ආදායමක් ලැබෙන සේ ඵලදායීව ආයෝජනය කිරීම කෙරෙහි අවධානය යොමුකර නොතිබුණි.

(ඇ) සමූපකාර අතිරික්ත අරමුදලට අයත් ස්ථාවර තැන්පතු ඇපයට තබා සමූපකාර සංගම් 02 කට 2004 හා 2008 වර්ෂවලදී රාජ්‍ය බැංකුවක් මඟින් රු. මිලියන 130 ක් වටිනා ණය සඳහා ඇප සුරැකුම් ලබාදී තිබුණි. නමුත් අදාල සංගම් විසින් ණය ගෙවීම පැහැර හැරීම හේතුවෙන් බැංකුව මඟින් රු. මිලියන 66.4 ක මුදලක් ස්ථාවර තැන්පතු වලින් හිලව් කරගෙන තිබූ අතර මෙකී මුදල් අදාල සංගම් වලින් අයකර ගැනීමට දෙපාර්තමේන්තුව විසින් කටයුතු කර නොතිබුණි.

(ඈ) 2008 වර්ෂයේ අතිරික්ත අරමුදලින් ව්‍යාපෘති ණය ලෙස සමූපකාර සමිතියකට ලබාදුන් රු.5,000,000 ක් වූ මුදල සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විටත් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

**4.2** **මතභේදයට තුඩු දෙන ගනුදෙනු**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) අරමුදලේ අරමුණු වලින් බැහැරව සමූපකාර සංවර්ධන දෙපාර්තමේන්තුවේ නිලධාරීන් 27 දෙනෙකුට ආපදා ණය හා යතුරු පැදි ණය ලබා දී තිබුණු අතර 2013 දෙසැම්බර් 31 දින වන විට පිළිවෙලින් රු.31,412 ක හා රු.200,629 ක ශේෂ අයවිය යුතුව පැවතුණි.

(ආ) ඉන්ධන පිරවුම්හලක් ඉදි කිරීම සඳහා සමූපකාර සමිතියකට සමාලෝචිත වර්ෂයේ දී රු.මිලියන 17 ක ණය මුදලක් ඇප සුරකුමකින් තොරව ලබාදී තිබුණි. පිරවුම්හල ඉදිකර ඇති භූමියේ නිරවුල් අයිතිය සමිතිය වෙත නොතිබුණු අතර ලංකා ඛනිජ තෙල් සංස්ථාවේ සිවිල් ඉංජිනේරුවරයකු විසින් එම ඉදිකිරීම් වටිනාකම රු.8,150,379 ක් ලෙස සහතික කර තිබුණු

බැවින් ලබාදුන් ණය මුදලින් රු.8,849,621 ක වටිනාකම කවර කාරණයක් සඳහා යොදා ගත්තාද යන්න මතභේදයට ලක්වන කරුණක් බව නිරීක්ෂණය වේ.
මෙවැනි තත්ත්වයක් යටතේ සමූපකාර සමිතියකට රු.මිලියන 17 ක් ඇපකරයකින් තොරව ලබාදීම විගණනයේදී ප්‍රශ්නකාරී වේ.

(ඇ) 2013 මැයි 08 දින රේඛීය අමාත්‍යාංශය යටතේ වූ රාජ්‍ය සංස්ථාවකට රු.මිලියන 75 ක ණය මුදලක් ලබාදීම සඳහා අරමුදල් කමිටුව විසින් ණය මුදල මාස 06 ක් ඇතුළත නිරවුල් කිරීමටත්, ණය වෙනුවෙන් ඇප සුරකුම් තැබීමට හා ණය සම්බන්ධයෙන් විධිමත් ගිවිසුමකට එළඹීමට යටත්ව අනුමැතිය ලබාදී තිබුණි. නමුත් ඊට පටහැනිව ණය ගිවිසුමක් හෝ ඇප සුරකුමක් තබා ගැනීමකින් තොරව අදාළ ණය මුදල ලබාදී තිබුණි.

(ඈ) ආරෝග්‍යශාලාවක් ඉදිකිරීම සඳහා ඉකුත් වර්ෂයේ හා සමාලෝචිත වර්ෂයේ සමූපකාර සමිතියක් වෙත රු.මිලියන 150 ක ණය මුදලක් ලබාදී තිබුණි. 2013 දෙසැම්බර් 31 දින වන විටත් එම ආරෝග්‍යශාලාව ඉදිකිරීමට අදාළ ඉඩමේ අයිතිය සමිතිය වෙත පවරාගෙන නොතිබුණු අතර ඉදිකිරීම් කටයුතු ප්‍රසම්පාදන ක්‍රියාවලියෙන් බැහැරව සිදු කර තිබුණි. ආරෝග්‍යශාලාව ඉදිකිරීම සඳහා සැලසුම් කර තිබුණේ මහල් 05 කින් යුතුව වුවත්, පසුව මහල් 02 දක්වා අඩුකර තිබුණද, ඇස්තමේන්තුගත මුදල අඩුකර නොතිබුණි. මෙම ඉදිකිරීම හේතුවෙන් සමූපකාර සමිතිය බිඳ වැටීමට ලක්වන බව පවසමින් අදාළ ඉදිකිරීමට එරෙහිව තහනම් නියෝගයක් ඉල්ලා සමිතියේ සාමාජිකයෙකු විසින් නඩුවක් පවරා තිබීම හා සමිතියේ මහා සභා රැස්වීම දින නියමයක් නොමැතිව කල් දැමීම වැනි අර්බුදකාරී තත්ත්වයන්ට සමිතිය ලක් වී තිබුණි. කෙසේ වුවද, එම කරුණු සැලකිල්ලට ගැනීමෙන් තොරව අරමුදල විසින් ණය මුදල නිදහස් කර තිබුණි. තවද මෙම ව්‍යාපෘතිය සඳහා උපදේශකවරයකු ලෙස වෛද්‍යවරයෙකු අවිධිමත් ලෙස බඳවාගෙන තිබුණු අතර, ඔහුගේ වැටුප් හා දීමනා ලෙස 2012 පෙබරවාරි සිට 2013 දෙසැම්බර් දක්වා රු.1,157,000 ක් අරමුදලින් ගෙවා තිබුණි.

(ඉ) ප්‍රසම්පාදන ක්‍රියාවලියෙන් බැහැරව හා පළාත් සමූපකාර කොමසාරිස්වරයාගේ අධීක්ෂණයෙන් තොරව පිහිනුම් තටාකයක් ඉදිකිරීමේ කොන්ත්‍රාත්තුවක් සඳහා සමාලෝචිත වර්ෂයේදී අතිරික්ත අරමුදලින් රු.11,749,500 ක මුදලක් මූල්‍ය ආධාරයක් ලෙස පාසැල් සමූපකාර සමිතියක් වෙත ලබා දී තිබුණි.

## 5. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

---

### 5.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

---

2006 දෙසැම්බර් 22 දිනැති අංක පීඑෆ් 423 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 4: 3 ඡේදය ප්‍රකාරව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2014 පෙබරවාරි 28 දිනට පෙර ඉදිරිපත් කළ යුතු වුවත්, අරමුදල 2014 මාර්තු 21 දින විගණනයට ඉදිරිපත් කළ මූල්‍ය ප්‍රකාශනවල පැවති අඩුපාඩු පෙන්වාදීමෙන් පසු 2014 ජූලි 31 දින එම මූල්‍ය ප්‍රකාශන ආපසු දෙපාර්තමේන්තුව වෙත භාරදෙන ලදී. නැවත සංශෝධිත මූල්‍ය ප්‍රකාශන 2015 මාර්තු 17 දින එනම් මාස 07 ක පමණ කාල ප්‍රමාදයකින් පසුව ඉදිරිපත් කර තිබුණි.

### 5.2 අභ්‍යන්තර විගණනය

---

සමූපකාර හා අභ්‍යන්තර වෙළඳ අමාත්‍යාංශයේ අභ්‍යන්තර විගණන ඒකකය මඟින් අතිරික්ත අරමුදලට අදාළව විගණන වැඩසටහන පිළියෙල කර තිබුණද, ඒ අනුව සිදු කරන ලද අභ්‍යන්තර විගණන වාර්තා සමාලෝචිත වර්ෂයේ අවසානය දක්වාම විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි.

## 6. පද්ධති හා පාලනයන්

-----------------------

විගණනයේදී අනාවරණය වූ පද්ධති හා පාලන අඩුපාඩු කොමසාරිස්වරයාගේ අවධානයට වරින් වර යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතුය.

(අ) ගිණුම්කරණය
(ආ) වත්කම් පරිපාලනය
(ඇ) ණය අයකර ගැනීම
(ඈ) සමුපකාර සමිති සඳහා ණය/ ආධාර ලබාදීම.
(ඉ) අරමුදල් උපයෝජනය